# සරණාගත සතියඃ සැමරීමට සහ මෙනෙහි කිරීමට අවස්ථාවක්

***Andrew Goledzinowski*** *ගෙන් පණිවුඩයක්*
*මිනිස් ජාවාරම සම්බන්ධ ගැටලු සහ මිනිසුන් නීතිවිරෝධී ලෙස එහා මෙහා ගෙනයාම සම්බන්ධ ඕස්ට්‍රේලියානු නියෝජිතයා*
*(Australian Ambassador for People Smuggling Issues and Human Trafficking)*

සරණාගත සතිය සහ සරණාගතයන් ලෙස මෙහි පැමිණි අයගෙන් ඕස්ට්‍රේලියානු සමාජයට සිදුකර ඇති දායකත්වය සැමරීමට 2017 ජුනි මාසයේ සියලුම ආකාරයේ ඕස්ට්‍රේලියානුවන් එක්විය. සරණාගතයින්ව පිළිගැනීම සහ ඔවුන්ව සාර්ථක ලෙස පදිංචිකරවීම සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියාව සතුව දීර්ග සහ ප්‍රෞඪ සම්ප්‍රදායක් ඇත.

දෙවන ලෝක යුද්ධය අවසානයේ සිට ලොව නන් දෙසින් පැමිණි සරණාගතයන් 865,000 කට අධික සංඛ්‍යාවක් ඕස්ට්‍රේලියාව තුල නැවත පදිංචි කර ඇත. ඇමෙරිකා එක්සත් ජනපදය සහ කැනඩාව සමඟ එක්ව, ඕස්ට්‍රේලියාව සරණාගතයන් හට ස්ථිර ලෙස නැවත පදිංචිය ලබාදෙන ලොව ඇති පළමු පෙලේ රටවල් තුනෙන් එකක් වශයෙන් දිගටම නම් දරා ඇත.

සරණාගතයන් නැවත පදිංචිකරවීමේ ඉතිහාසය සැමරීමේදී, අපගේ පරිත්‍යාගශීලී මානුෂික හිතවාදී වැඩසටහන තුළ ශක්තිමත් දේශසීමා ඉටුකරන කාර්යභාරය අගය කිරීම වැදගත්වේ. ආරක්ෂාකාරී දේශසීමා මගින් අවදානම් අවම කරන ආකාරයට රජය මගින් සංක්‍රමණය කළමණාකරණය කිරීම සහ මානුෂික උපකාර ලබා දෙන්නේ එවා වැඩි වශයෙන්ම අවශ්‍ය අයට බවට මහජන විශ්වාසය ගොඩනැගේ.

මෙම විශ්වාසය නොමැතිව, ඕස්ට්‍රේලියානු රජය හට 2018-19 මුදල් වර්ෂය තුළදී ඕස්ට්‍රේලියාවේ වාර්ෂික මානුෂික වැඩසටහනේ ප්‍රමාණය 18,750 දක්වා වැඩි කිරීමට ඇති කැපකිරීම සිදුකිරීම කල නොහැකිව තිබිණි.

අපගේ දේශසීමා පාලනය කිරීම හේතුවෙන් අපගේ වාර්ෂික වශයෙන් ගනු ලබන සරණාගත සංඛ්‍යාවට අමතරව සිරියානු සහ ඉරාක සරණාගතයන් 12,000 ක් ගැනීමට රජයට අවස්ථාව ලැබිණි.

ඕස්ට්‍රේලියාව වෙත මිනිස් ජාවාරම් බෝට්ටුවක් පැමිණ වසර තුනකට පෙර වන අතර, ඊටත් වඩා වැදගත් වන්නේ, මිනිස් ජාවාරම හේතුවෙන් යම් අයෙකු මුහුදේ ගිලී මියයාමට වසර තුනක් ගතවී තිබීමයි. මෙම වාර්තාව ඕස්ට්‍රේලියානු තද දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්තිවල ඍජු ප්‍රතිපලයකි.

අවාසනාවකට මෙන්, මිනිස් ජාවාරම්කරුවන් විසින් අසරණ මිනිසුන් හට ඕස්ට්‍රේලියාවේ පදිංචිවිය හැකි බවට ලබාදෙන බොරු පොරොන්දු මත ඔවුන්ගෙන් මුදල් ගසාකන බව අපි දනිමු. සත්‍ය වශයෙන්ම ඕස්ට්‍රේලියාවට නීතිවිරෝධී ලෙස බෝට්ටුවෙන් ලගාවීමට උත්සාහ කරන ඕනෑම අයෙකුව නැවත හරවා යැවීම හෝ නැවත තමා පැමිණි රටට හරවා යැවීමට කටයුතු කරනු ඇත. ඕස්ට්‍රේලියාවට නීතිවිරෝධී ලෙස මුහුදින් පැමිණෙන මාර්ගය වසා ඇත. එය දිගටම එසේ වසා තබනු ඇත.

ඕස්ට්‍රේලියානු රජයේ දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති මගින් ජීවිත ආරක්ෂා කිරීම සහ මිනිස් ජාවාරම තුරන් කරන අතරම සෑම වසරකම ඒ සඳහා නියම වශයෙන් සුදුසුකම් ඇති දහස් ගණන් සරණාගතයන් හට ඕස්ට්‍රේලියාවේ නැවත පදිංචියට අවශ්‍ය පසුබිම සකස් කරනු ඇත.

වැඩිදුර විස්තර සඳහා මෙම වෙබ් අඩවිය වෙත පිවිසෙන්නඃ www.osb.border.gov.au